


# ඔබාමා - රොම්නි
## එකම කාසියේ දෙපැත්ත

ශ්‍රීලාල් සෙනෙවිරත්න

මේ ලිපිය මා ලියමින් සිටින අවස්ථාවේදී ලෝකයේ වෙසෙස් අවදානය යොමුව තිබුණේ ඇමරිකාවේ නව ජනාධිපතිවරයා කවුරුන් විය හැකිද යන්න පිළිබඳවය. නොවැම්බර් 06වෙනි දින පැවැත්වෙන ජනාධිපතිවරණයේදී බලයට පත්වන්නේ වත්මන් ජනාධිපති මෙන්ම ඇමරිකාවේ ප්‍රථම කලු ජාතික ජනාධිපතිවරයා වූ බැරැක් ඔබාමාද? නැතහොත් ප්‍රතිවාදී රිපබ්ලිකන් පක්ෂයේ අපේක්ෂක මිට් රොම්නිද?

ඔබ මෙය කියවන අවස්ථාව වන විට බොහෝ දුරට මේ ගැටළුව විසඳී තිබෙන්නට පුළුවන. ඇමරිකාවේ ජනාධිපතිවරණ පැවැත්වෙන විට මුලින්ම කරළියට එන්නේ ජයග්‍රාහකයා

***ඔබාමා ජනපති පදවියට පත්වුව හොත් ඇමරිකාවේ ගමන් මඟ වෙනස් වනු ඇතැයි ඇමරිකානුවන්ට වඩා විශ්වාස කළෝ ලෝකවාසී සෙසු ප්‍රජාවය. ඇමරිකාව රඟදක්වන ලෝක පොලිස්කාරයාගේ භූමිකාවේ වෙනසක් ඇතිවන්නේ නම් එය ලෝක ප්‍රජාවගේ මහත් ප්‍රසාදයට හේතුවන්නක් විය.***

කවුරුන්ද යන්න පිළිබඳ ජනමත සමීක්ෂණයන්ය. අනතුරුව අපේක්ෂකයන් අතර වන රූපවාහිනී සංවාදය. එම අදියරයන් නිම වන විට ඉන් පසුව එන ජනාධිපතිවරණ ඡන්ද විමසීමේදී ජයග්‍රහණය කරන්නේ කවුරුන්ද යන්න අනුමාන කරගත හැකිය.

සැප්තැම්බර් මාසයේ පැවැති ජනමත සමීක්ෂණ අනුව ඉදිරියෙන් සිටියේ ඩිමොක්‍රටික් අපේක්ෂක, ජනාධිපති බැරැක් ඔබාමාය. ඔහු ජයග්‍රහණය කරන බව 49.1%ක් ප්‍රකාශ කළහ. ප්‍රතිවාදී රිපබ්ලිකන් පක්ෂ අපේක්ෂක මිට් රොම්නි ජයගන්නා බවට විශ්වාසය පළකොට තිබුණේ 45.6%ක් පමණි. අපේක්ෂකයන් දෙදෙනාගේ ජනාධිපතිවරණ ප්‍රචාරක සටනේ ආරම්භක අවදියේ පැවැති ඒ තත්ත්වය පසුව වෙනස් වූයේ ඔබාමා පරයා රොම්නි ඉදිරියට ඒමෙනි. ඔක්තෝබර් මුල් සතියේ ජනමත සමීක්ෂණ ප්‍රතිඵල අනුව ඔබාමා ලද මනාප ප්‍රතිශතය 46.1%ක් වන විට රොම්නි 47.6%ක් ලබාගෙන ඉදිරියෙන් සිටියේය. ඔක්තෝබර් 04වෙනිදා පැවැති පළමුවෙනි රූපවාහිනී සංවාදය රොම්නිගේ ජනප්‍රියත්වය වැඩි කරන්නට හේතු වී තිබිණ. එහිදී අපේක්ෂකයන් දෙදෙනා සංවාදයේ යෙදුණේ ඇමරිකාවේ අභ්‍යන්තර දේශපාලනය සහ ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධයෙනි.

අපේක්ෂකයන් දෙදෙනා අතර අවසන් රූපවාහිනී සංවාදය පවත්වනු ලැබුවේ ඔක්තෝබර් 22 දිනය. ඇමරිකාවේ විදෙස් ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් සාකච්ඡා කෙරුණු මේ විවාදයෙන් රොම්නි පරදා ජනපති ඔබාමා නැවත පෙරට ආවේය. මේ ආකාරයෙන් පූර්ව මැතිවරණ සමය පුරා අපේක්ෂකයන් දෙදෙනා කරට කර සටනක සිටි බව දක්නට ලැබිණ. ඇමරිකානුවන්ගේ අදහස් පළකිරීම්වලින් කියැවුණේ මේ දෙදෙනාම ඇමරිකාවේ ජනාධිපති ධුරය සඳහා සුදුසු බවය. එබැවින් නව ජනාධිපතිවරයා ඔබාමාද, රොම්නිද යන්න ඇමරිකානුවන්ට එතරම් වැදගත් නැත. මන්ද ඇමරිකාවේ ගමන් මගේ කේන්ද්‍රීය වෙනසක් කරන්නට මේ කවුරු ජනපති වුවද ඔහුට හැකියාවක් නොමැති බැවිනි.

මේ බව ලෝකයා හමුවේ කදිමට ඔප්පුකර පෙන්වූයේ බැරැක් ඔබාමාය. 2008 ජනාධිපතිවරණයට ඔබාමා තරඟ කිරීමම ලෝකයේ වෙසෙස් අවධානයට ලක්වූයේ ඔහු මුස්ලිම් සම්භවයක් ඇති කළු ජාතිකයකු වූ බැවිනි. කලු ජාතිකයකු ජනපතිවරණයට තරඟ කිරීමම ඇමරිකාවේ දේශපාලන ඉතිහාසයට සුවිශේෂී සිදුවීමක් විය.

ඔබාමා ජනපති පදවියට පත්වුව හොත් ඇමරිකාවේ ගමන් මඟ වෙනස් වනු ඇතැයි ඇමරිකානුවන්ට වඩා විශ්වාස කළෝ ලෝකවාසී සෙසු ප්‍රජාවන්ය. ඇමරිකාව රඟදක්වන ලෝක පොලිස්කාරයාගේ භූමිකාවේ වෙනසක් ඇතිවන්නේ නම් එය ලෝක ප්‍රජාවගේ මහත් ප්‍රසාදයට
හේතුවන්නක් විය. ඔබාමා ජයග්‍රහණය කරවීමට ඡන්දය දීමේ හැකියාවක් නැතත් ජාත්‍යන්තර වශයෙන් ලබාදිය හැකි සෙසු සෑම ආකාරයකම සහායක් ලෝක ප්‍රජාවගෙන් ඔබාමාට ලැබුණේ එබැවිනි.
ඔබාමා ජනපති පදවියට පත්ව මේ වන විට වසර පහක් ඉක්ම ගොසිනි. ආපසු හැරී බලන විට පෙනෙන්නට ඇත්තේ කුමක්ද? ඇමරිකාවට කලු ජාතික මුස්ලිම් සම්භවයක් ඇති ජනාධිපතිවරයකු පත්වීමෙන් ලෝක ප්‍රජාව අපේක්ෂා කළ වෙනස ඇතිවූයේද?

ඔබාමා බලයට පත්කරගන්නා විට ඇමරිකානුවන්ට විසඳාගත යුතුව තිබූ ප්‍රධාන ප්‍රශ්ණය වූයේ රට මුහුණ පා සිටි ආර්ථික අර්බුධයයි. මූල්‍ය ආයතන කඩා වැටෙමින්, උද්ධමනය වේගයෙන් ඉහළ නගිමින්, විරැකියාව ඉහළ යමින් පැවැති වට පිටාවක ඇමරිකානුවන්ට එදා වේල සොයා ගැනීමද ප්‍රශ්ණයක් වෙන තැනට කටයුතු සිදුවෙමින් තිබිණ. ඔබාමාගේ පළමු ධුර කාලය අවසන් වන විට රට මුහුණ දී තිබූ ඒ ආර්ථික අර්බුධයෙන් මුදාගෙන




නැවතත් නිසි පිලිගත කිරීමකට ඔහු සමත්විය. එය ඇමරිකානුවන්ගේ අපේක්ෂා මුදුන්පත් කරලීමකි. එහි ගෞරවය ඔබාමාට හිමිවෙතත් එය ඔබාමාගේ විශිෂ්ඨ රාජ්‍ය තාන්ත්‍රික භාවයේ ප්‍රතිපලයක් ලෙස සැළකිය නොහැකිය. සමකාලීන බටහිර ධනවත් රටවල් රැසක් එම ආර්ථික අර්බුධයට මුහුණ පෑ අතර ඒ සෑම රටක්ම වාගේ මේ වෙන විට ඉන් නිදහස් වෙමින් සිටින්නේය. කෙසේ වුවද ඇමරිකාව ආර්ථික අර්බුධයෙන් මුදාගැනීමේ ගෞරවය ඔබාමාට හිමිවේ.

ඔබාමාගෙන් ඇමරිකානුවන්ට ඉටුවූ සදානුස්මරණ සේවය ලෙස ඇමරිකානුවන් සළකන්නේ සිය පරම සතුරා වූ අල්-ක්වයිදා නායක ඔසාමා බින් ලාඩන් මරා දැමීමය. 9/11 ප්‍රහාරයෙන් පසු ඔසාමා දඩයම් කිරීමට ඇමරිකාව කළ සැළසුම වසර දහයකට පමණ පසු සාර්ථක ලෙස අවසන් කරනු ලැබුවේ ඔබාමාගේ නායකත්වයෙනි. එල්ටීටීඊ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් ඝාතනය කර ඊළාම් යුද්ධය අවසන් කිරීමෙන් ජනාධිපති මහින්ද රාජපක්ෂ අත්කරගත් දේශපාලන වාසිය කෙතෙක්ද, ඔසාමා ඝාතනයෙන් බැරැක් ඔබාමා අත්කරගත් දේශපාලන වාසියද එපමණම වේයැයි කිව හැකි ය.

මේ තරමින්ම වැදගත් නොවුණත් ඇමරිකාව වෙනුවෙන් තවත් බොහෝ දේ කරන්නට ඔහු උත්සාහ දැරුවේය. නිදහස් සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමයක් හදුන්වාදීමට දැරූ උත්සාහය ඒ අතරින් කැපී පෙනෙයි. එවැනි උත්සාහයන් අතරින් ඇතැම් ඒවා සාර්ථක විය. තවත් ඒවා අසාර්ථක

39 වන පිටට




### 2012 ඔක්තෝබර්

01. මාලදිවයිනේ ප්‍රගතිශීලී පක්ෂයේ මන්ත්‍රී අස්රාෆ් අලි (46) එරට අගනුවරට ආසන්නයේ පිහිටි ඔහුගේ නිවෙසේදී ඝාතනය කෙරේ. තියුණු ආයුධයකින් පහරදී සිදුකර ඇති මෙම ඝාතනය මාලදිවයිනෙන් වාර්තාවන ප්‍රථම මන්ත්‍රී ඝාතනයයි.

02. දූෂණවලට එරෙහි සිවිල් සමාජ ක්‍රියාකාරිකයකු වන අර්වින්ද් කේජ්රිවාල්ගේ ප්‍රධානත්වයෙන් දූෂණ වංචාවලට එරෙහිව ඉන්දියාවේ නව දේශපාලන පක්ෂයක් පිහිටුවයි.

07. වෙනිසියුලාවේ ජනාධිපතිවරණයෙන් හිටපු ජනපති හියුගෝ චාවේස් නැවතත් ජනාධිපතිවරයා ලෙස තේරී පත්වෙයි. ජනාධිපතිවරණයේදී ප්‍රකාශිත ඡන්ද ප්‍රතිශතය 90%ක් වූ අතර ඉන් 54.42ක් චාවේස් හිමිකරගත් අතර විපක්ෂයේ පොදු අපේක්ෂකයාට හිමිවූයේ 44.97ක් පමනකි.

09. ළමා අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නගන පාකිස්ථාන දැරියක වන මලාලා යුසාන්සාට තලේබාන් සංවිධානයේ තුවක්කුකරුවෝ වෙඩි තබති. හිසට එල්ල වූ වෙඩි පහර හේතුවෙන් මරණීය තුවාල ලැබූ දැරිය රෝහල්ගත කෙරේ.

10. තුර්කි ගුවන් හමුදාව උඩුගුවනේදී සිරියානු ගුවන් යානයක් අත්අඩංගුවට ගෙන තුර්කිය වෙත ගෙන යයි. රුසියාවේ සිට සිරියාව බලා පියාසර කරමින් තිබුණු ගුවන් යානයේ ආයුධ ගෙන යන බව පවසමින් තුර්කිය මේ ක්‍රියාව සිදුකර ඇත .

21. බොලිවුඩ් සිනමාවේ ජනකාන්ත අධ්‍යක්ෂවරයකු වූ යාෂ් චොප්රා ඩෙංගු උණ වැළදී අභාවප්‍රාප්ත වේ. ලොව පුරා කෝටි සංඛ්‍යාත ප්‍රේක්ෂකයන්ගේ මහත් ආදරය දිනාගත් ප්‍රේම වෘතාන්ත චිත්‍රපට රාශියක් නිර්මාණය කළ චොප්රා මියයන විට වයස අවුරුදු 82කි.

22. මැතිවරණ ප්‍රචාරක කටයුතුවල නිරත වෙමින් සිටි පින්ලන්ත අගමැති ජිරිකී කටයිනන්ට එරට වැසියෙකු පිහියෙන් අනින්නට දැරූ උත්සාහයක් ආරක්ෂක නිලධාරින් විසින් වළක්වාලයි.

26. ඉස්ලාම් දහම ලෝකයට හදුන්වා දුන් දිනය අනුස්මරණය කෙරෙන හජ් උත්සවය නිමිත්තෙන් සිව් දින සටන් විරාමයක් ක්‍රියාත්මක කිරීමට අල් අසාද්ගේ ආණ්ඩුව සහ කැරලිකරුවන් එකඟ වේ.

29. සිව් දින සටන් විරාමය අවසන් කරමින් සිරියානු නිදහස් හමුදාව (කැරලිකරුවන්) කාර් බෝම්බයක් පුපුරුවා හරියි.

සිංහලෙන් පැය දෙකක්
FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා

රංජිත් රූබි සමඟ පැය තුනක් විනෝදය සහ නැවුම් ගීත සමගින් සෑම ඉරිදාවකම රාත්‍රී 8 ට හමුවෙමු
Voice of Lanka
97.7FM 3SER

ලක් මිහිර
සිංහල ගුවන් විදුලිය
සෑම බ්‍රහස්පතින්දාම සවස 6 සිට 8 දක්වා
FM 88.6

FM 94.1
ලක් මිහිර South
අඟහරුවාදා රාත්‍රී
10 - 12 දක්වා
අසන්න - විඳින්න